# විභාග - විභාග ප්‍රතිඵල ආදිය

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

Open Competitive Examination for Recruitment to Post of Inspector of Excise in Excise Department of Sri Lanka - 2026

**සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුරෙහි පවතින පුරප්පාඩු පනස් හතරක් (54) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීමට පවත්වනු ලබන තරග විභාගයට පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ** www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications (Recruitment/ EB Exams)" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (Online) ක්‍රමයට පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 නොවැම්බර් මස 09 වැනි දින පෙ.ව 9.00ට විවෘත වන අතර 2026 දෙසැම්බර් 07 වැනි දින ප.ව 9.00ට අවසන් වේ.**

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳදරා ගත යුතු ය.

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2027 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ඇත.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :**

විභාග කොමසාරිස් ජනරාල් මගින් ලිඛිත තරග විභාගයක් පවත්වා එම ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ.

**තනතුරේ සාමාන්‍ය රාජකාරි විස්තරය :**

සුරාබදු ආඥාපනත, වස විෂ අබිං හා අන්තරාදායක ඖෂධ ආඥාපනත, දුම්කොළ බදු පනතට අදාළව රාජකාරි කටයුතු ඉටු කිරීම, කාර්යාල පරිපාලනය හා අධීක්ෂණ රාජකාරි ඉටු කිරීම.

**02. වැටුප් ප්‍රමාණය : RS 4 – 2025 රු.63,070-24 X 1190 – 91,630/- මාසික වැටුපක් මෙම තනතුරට අයත් වේ. (රා.ප.ව 10/2025ට අනුව)**

**03. වයස් සීමාව :**

අයදුම්කරුවන් 2026.12.07 දිනට වයස අවු.21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (සුරාබදු දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු දරන උපාධිධාරීන් සඳහා වයස් සීමාවක් නොමැත.)

"ඒ අනුව 2005.12.07 දිනට හෝ ඊට පෙර හා 1991.12.07 දිනට හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත."

**04. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

I. විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදාන ආයතනයකින් ලත් උපාධියක් ලබා තිබීම.

II. ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන්ට අ.පොස. (සා.පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

4.1 කායික සුදුසුකම් :

I. අවම උස (පාවහන් නොමැතිව) අඩි 5 අඟල් 06ක් විය යුතු ය. පපුවේ මිනුම් ආශ්වාස නොකොට අඟල් 33ක් තිබිය යුතු ය.

II. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්ණාඩියක් (කන්ටැක් ලෙන්සර්) රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 වශයෙන් ඇස් පෙනීමකින් යුක්ත විය යුතු ය.

III. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

4.2 වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමන් ලකුණු* |
|---|---|---|---|
| 01. අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40 % |
| 02. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 01 | 100 | 40 % |

**ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර :**

**විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. අභියෝග්‍යතාව | ඉල්ලුම්කරුගේ බුද්ධිය, තර්කනය, තීරණ ගැනීමේ හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (ගණිතය/ චිත්‍ර ගැටලු, සමාන/විරුද්ධ පද ලිවීම, වාක්‍යාංශ/වාක්‍ය සෑදීම, හිස්තැන් පිරවීම පිළිබඳ ප්‍රශ්න ද ඊට ඇතුළත් වෙනවා ඇත) |
| 02. පොදු ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ හා ලෝකයේ කාලීන හා සාමාජීය සිදුවීම් පිළිබඳව තොරතුරු හා සාමාන්‍ය දැනුම මැන බැලීම |

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය - ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමුකර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණුවල එකතුවේ කුසලතාවේ අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ. එසේ වුව ද කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් නොපිරවීම සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් තීරණය කළ හැකිය.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු ලැබේ.

| *ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br><br>පශ්චාත් උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, මූලික සුදුසුකමට අමතර උපාධියක් සඳහා සහ ප්‍රථම උපාධියේ පන්ති සාමාර්ථය අනුව | 20 |
| 2. භාෂා හැකියාව | 10 |
| 3. **ක්‍රීඩා කුසලතා**<br><br>විවිධාකාරයේ ක්‍රීඩා සම්බන්ධයෙන් ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා පාසල් තරගවලදී දක්වන ලද වාර්තාගත දස්කම් සඳහා | 35 |
| 4. වෙනත් කුසලතා<br><br>**විශේෂිත පුහුණු**<br>ශිෂ්‍යභට / ස්වේච්ඡා සේවය / ආත්මාරක්ෂක පුහුණු සටන් ක්‍රම හෝ තාක්ෂණ පුහුණුව<br><br>**බාහිර ක්‍රියාකාරකම්** | 30 |
| 5. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම් | 05 |
| **එකතුව** | **100** |

**05. සේවා කොන්දේසි :**

**I. රාජ්‍ය භාෂා නීතිය හා රජය විසින් වරින්වර පනවනු ලබන සියලුම නීති රෙගුලාසි අනුව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතු ය.**

**II. 2310/29 හා 2022.12.14 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද කාර්යපටිපාටික රීතිවල I කාණ්ඩයේ III වැනි පරිච්ඡේදය VII වෙනි පරිච්ඡේදය හා VIII වෙනි පරිච්ඡේදය අදාළ වේ.**

**III.** ශාරීරික සුදුසුකම් අයදුම්කරුවන් කෙරෙහි තිබෙදැයි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර පරීක්ෂා කරනු ලැබේ.

06. පුහුණු කාලය :

තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට මාස 03ක පුහුණුවක් ලබා දෙනු ලැබේ. මෙම කාලසීමාව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් නොවන අයගේ පුහුණුව අවසන් කරනු ලැබේ. පුහුණු කාලය තුළ දී පුහුණුවන්නන්ට රු.20,000/-ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

07. පරිවාස කාලය:

සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන අපේක්ෂකයින් තුන් (03) අවුරුදු පරිවාස කාලයකට යටත්කොට සුරාබදු

පරීක්ෂක තනතුරට පත් කරනු ලැබේ. පරිවාස කාලය අවසානයේදී අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වුවහොත් අදාළ තනතුරේ ස්ථීර කරනු ලැබේ.

7.1 තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මහහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

08. විභාග මාධ්‍ය :-

(*අ*) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත් වේ.

(*ආ*) අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි ය.

*සටහන:*

(i) අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් පමණි.

(ii) අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iii) සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර (02) ටම පෙනී සිටිය යුතු ය.

09. විභාග අයදුම්පත්:

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපෑල් (E-mail) ලිපිනයට හෝ දැනුම්දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. විභාග ගාස්තු රු.1,200/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Cards);

II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Dedit Card with the Facility of Internet Transactions);

III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon);

IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Teller Slip Payment).

*සටහන:*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

11. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්

වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

12. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සැහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

13. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

14. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවේ.

15. පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/ මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. **විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.**

**16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.**

**එම්.බී.එන්.ඒ.පේමරත්න,**
සුරාබදු කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353, කෝට්ටේ පාර,
රාජගිරිය.

11 - 72

---

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීම - 2025/2026

### Publishing of Vacancies for the Recruitment of the officers to the Grade **III** of the Sri Lanka Principals Service - 2025/2026

අංක 2,463 හා 2025.11.14 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* පළකරන ලද "ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2025" *ගැසට් නිවේදනයේ* විධිවිධාන පරිදි 2026.06.07 දින පවත්වන ලද ලිඛිත තරග විභාගයේ හා ඉදිරියේ දී පැවැත්වීමට නියමිත සම්මුඛ පරීක්ෂණවල ප්‍රතිඵල මත පදනම්ව පහත දැක්වෙන දිස්ත්‍රික්කයන්හි රජයේ පාසල්වල (ජාතික හා පළාත් පාසල්) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ අනුමත තනතුරුවල 2026.10.05 දිනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

| *අනු. අංකය* | *දිස්ත්‍රික්කය* | *ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව* | |
|---|---|---|---|
| | | *සිංහල මාධ්‍ය* | *දෙමළ මාධ්‍ය* |
| 01 | කොළඹ | 55 | 2 |
| 02 | ගම්පහ | 234 | 16 |
| 03 | කළුතර | 95 | 56 |
| 04 | මහනුවර | 2 | 106 |